# සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
## සබරගමුව පළාත් සභාව
## ටෙන්ඩර් කැඳවීමයි

සබරගමුව පළාතේ කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි මගීන් සඳහා සාමාන්‍යය පොදු ප්‍රවහන පහසුකම් ලබා දීම වෙනුවෙන් බස්රථ සඳහා නව මාර්ග වල බලපත්‍ර නිකුත් කිරීම සඳහා තරඟකාරී මිල ගණන් කැඳවීමට තීරණය කර ඇත. ඒ අනුව එම මාර්ග සඳහා අවම ලංසුගත මුදල හා අදාළ තොරතුරු පහත පරිදි වේ.

---

| අ/අ | දිස්ත්‍රික්කය | මාර්ගය | අවම ලංසුගත මුදල (රු) | බලපත්‍ර ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 01 | කෑගල්ල | නිර්මලාවත්ත කලුපහන බුලත්කොහුපිටිය | 200,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 02 | කෑගල්ල | පුස්සැල්ල - කෑගල්ල(දේවාලේගම හරහා) | 300,000.00 | 1 | ❖ පැවති කාලසටහනම ලබාදේ |
| 03 | කෑගල්ල | අත්තනගොඩ - කෑගල්ල | 300,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 04 | කෑගල්ල | ගංතුන - දිප්පිටිය | 300,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 05 | කෑගල්ල | කුමාරපුර දෙබත්ගම දිප්පිටිය | 200,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 06 | කෑගල්ල | ඉඹුලෝවිට යද්දෙහිමුල්ල හරහා මැදගොඩ වරකාපොළ | 200,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 07 | රත්නපුර | කහවත්ත සිට කට්ටංගෙ හරහා ඕපනායක | 100,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 08 | රත්නපුර | ඇහැළියගොඩ - පළීගල | 100,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 09 | රත්නපුර | යටාගර සිට මනන්දොල වත්ත-නිවිතිගල | 300,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 10 | රත්නපුර | ලණුවැල්ල කොස්කොළවත්ත ගොඩිගමුව හරහා රත්නපුර | 150,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |
| 11 | රත්නපුර | අළුත්පාර තැන්නඋඩ ගුරුබැවිලාගම වැල්ලවල අළුපොල රෝහල හරහා වේවැල්වත්ත | 200,000.00 | 1 | ❖ අයදුම්පත සමග කාල සටහන ලබාදේ |

**<u>කොන්දේසි</u>**

01.ඉල්ලුම්කරු සබරගමුව පළාතේ පදිංචිකරුවකු විය යුතුය.
02. ඉල්ලුම් කරනු ලබන මුදල අවම ලංසුගත මුදලට වඩා වැඩි අගයක් විය යුතුය.
03. මාර්ග බලපත්‍ර සඳහා අයදුම්පත්‍ර ගාස්තුව වන රු.1000/-ක්ද, වාර්ෂික බලපත්‍ර සඳහා ගෙවිය යුතු සේවා ගාස්තු (ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදල), එක් වරකට සුභසාධක ගාස්තු වන රු.5000/-ක්ද ගෙවිය යුතු අතර, වාර්ෂිකව අළුත්කිරීමේ බලපත්‍ර ගාස්තුව රු.6700/-ක්ද ගෙවිය යුතුය.
04. බලපත්‍ර කොන්දේසිවලට යටත්ව වසර 10 ක් සඳහා ස්ථිරවම ලබාදෙන අතර වසර 5කට වරක් ලංසු මුදලින් 10% ක පරිපාලන ගාස්තුවක් ගෙවිය යුතුය.
05. මාස 03 කට වැඩි කාලයක් බලපත්‍ර ලබාගත් අය විසින් ධාවනයට එක්කරනු නොලැබේ නම් හේතු නොදක්වා බලපත්‍රය අහෝසිකිරීමේ බලය සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති සතුය.
06. මාර්ග බලපත්‍රය නිකුත් කිරීමේ/ නොකිරීමේ අයිතිය සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති සතුය.
07.බලපත්‍රය ඍජුව පැවරිය නොහැක( බලපත්‍රය පැවරීමට අවශ්‍ය නම් ආයතනය ප්‍රථමව දැනුවත් කළ යුතුය).
08. ටෙන්ඩර් කිරීමේදී ආපසු ගෙවන ලද රු.5000/- තැන්පතු මුදලක් ටෙන්ඩර් ගාස්තු ලෙස අයකරන අතර, එය ටෙන්ඩරය අවසානයේ ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. නමුත් ටෙන්ඩරය ලබාගත් ඉල්ලුම්කරු ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ රු.5000/- තැන්පතු මුදල මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගිණුමට බැරවන අතර නැවත කිසිදු ප්‍රසම්පාදන කටයුත්තක් සඳහා අවකාශ ලබා නොදෙනු ලැබේ.

## ඉල්ලුම් කිරීම

කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල ප්‍රවාහන අධිකාරියේ අයකැමි වෙතින් රු2000/- ආපසු නොගෙවන මුදලක් ගෙවා අයදුම්පත්‍රය පුරවා 9*4 ලිපි කවරයක බහා හොඳින් අලවා එම කාර්යාලවල තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අයදුම් පත් දෙක (Original/Duplicate) බහාලිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන මාර්ගය හා දිස්ත්‍රික්කය සඳහන් කල යුතුය. සෑම අයදුම්පත්‍රයක් සමඟම විස්තර පත්‍රිකාවක් ඔබට ලබාදෙනු ඇත.

- ගෙවන ලද රු.1000/- රිසිට්පත රු.5000/- ටෙන්ඩර් ගාස්තුවට අදාල රිසිට්පත අයදුම්පත්‍රයේ ඇලවිය යුතුය.
- මෙම ලිපි කැඳවීමේ අවසන් දිනය 2025/05/15දින වන අතර, එදින ප:ව:2.30ට මිල කැඳවීමේ කාලය අවසන් වේ.
- 2025/05/15වන දින සවස 3.40ට ඉල්ලුම්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හමුවේ ටෙන්ඩර් පෙට්ටිය විවෘත කරනු ඇත.
- 2025/05/15. වන දින ප:ව:2.00 වන තෙක් අදහස් හා විරෝධතා දැන්වීම සඳහා කාලය ලබාදෙන අතර, ඉන්පසුව ඇගයීම් කමිටුව වෙත අදාල බලපත්‍ර ලබාදීමෙන් නිර්දේශ ලබාදෙන අතර නැවත ස්ථිර ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අනුමැතිය ලබාදීමෙන් පසු මාර්ග බලපත්‍ර ලබාදීමට කටයුතු කරනු ලැබේ.
- ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසු ඇගයීම් කමිටුව මගින් ඇගයීමක් කර ඉහල මිල ඉදිරිපත් කල ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩර් ප්‍රදානය කරනු ලබයි.
- ඉහලම මිල ඉදිරිපත් කර ඇති ඉල්ලුම්කරුවන් අදාල මුදල 2025/05/29 ප:ව:2.30 ට පෙර ගෙවීම් කල යුතුය.
- ඉල්ලුම්කරුවන් විසින් අදාල මුදල රත්නපුර, කෑගල්ල මුදල් අයකැමි වෙත එකවර මුදලින් ගෙවීමට කටයුතු කල යුතුය.

**සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, නිල වෙබ් අඩවිය https://sgprpta.sg.gov.lk/ හා දුරකථන අංක 045-2222085/035-2232295 ඔස්සේ වැඩිදුරටත් තොරතුරු ලබාගත හැකිය.**

**සභාපති,**
**ප්‍රසම්පදාන කමිටුව,**
**සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,**
**සබරගමුව පළාත් සභා සංකීර්ණය,**
**නව නගරය,**
**රත්නපුර.**